# සංස්කෘතයේ ආඛ්‍යාත හා පද සාධනය පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීමක්

පැලියගොඩ විද්‍යාලංකාර පරිවේණාචාර්ය,
ගෞරව ශාස්ත්‍රවේදී, රාජකීය පණ්ඩිත,
පූජ්‍ය බලදොර ඉන්ද්‍රජෝති හිමි.

**''ආඛ්‍යායතීති ආඛ්‍යාතම්''** යනු ආඛ්‍යාත පිළිබඳ ව වෛයාකරණඥයින් විසින් අති සංක්ෂිප්තයෙන් දක්වන ලද නිර්වචනයයි. ප්‍රකාශ කෙරෙනුයේ ආඛ්‍යාත නම් වේ යනු එහි අර්ථය යි. ''කර්තෘගේ ව්‍යාපරය ප්‍රකාශ කෙරෙයි'' යන්න මෙහිදී අදහස් වෙයි. වාක්‍යාර්ථය සමර්ථනය කිරීමෙහි මුඛ්‍යත්වය දරන්නේ කර්තෘ නම් වේ. තත් කර්තෘ පිළිබඳ ව වූ වාක්‍යර්ථය සමර්ථනය කිරීමෙහි මුඛ්‍යත්වය දරන්නේ කර්තෘ නම් වේ. තත් කර්තෘ පිළිබඳ ව වූ වාක්‍යර්ථය සමර්ථනය කිරීමෙහිලා යම්බඳු ව්‍යාපාරයෙක් කර්තෘ කෙරෙහි පිහිටියේ ද තත් ව්‍යාපාරය යමකින් ප්‍රකාශ කරනු ලැබේ නම් ඒ ආඛ්‍යාත නම් වේ. මෙහි ආඛ්‍යාත යන්නෙහි නිර්වචන දක්වන්නා වූ ටීකා ආචාර්යවරයෝ, **''ආඛ්‍යාතයන්තේ කථ්‍යන්තේ අර්ථාත් නිෂ්පාද්‍යන්තේ භ්වාදිනාං රූපානි යෙන තදාඛ්‍යාතම්''**[1] යනුවෙන් කරණ සාධන වශයෙන් ද **''ආඛ්‍යාංත ආචාක්‍ෂයතේ කර්තුර් ව්‍යාපාරමිත්‍යාඛ්‍යාතඃ''**[2] යනුවෙන් කර්තෘ සාධන වශයෙන් ද ආඛ්‍යාත හඳුන්වත්, මෙහි පළමු වාක්‍යයෙන් ''භූ'' ආදී ධාතුන්ගේ රූප යමකින් නිපදවනු ලැබෙත් නම් ඒ ආඛ්‍යාත යයි ද දෙවැනි වාක්‍යයෙන් කර්තෘව්‍යාපාරය ප්‍රකාශ කරන්නෝ ආඛ්‍යාතයෝ යයි ද කියවේ. ආඛ්‍යාත පදයක් නිර්මාණය වීමට අවශ්‍ය මූලිකාංග නම් ධාතු සහ ආඛ්‍යාත ප්‍රත්‍යයෝ යි. එම ධාතුව ප්‍රත්‍යය සමඟ සම්බන්ධ වීමට පෙර ධාත්වංගය බවට සංවර්ධනය වේ. ධාත්වංගය දක්වා ධාතුව සංවර්ධනය වන්නේ විකරණය හා එක් වීමෙන් හෝ ධාතුව ද්විත්ව වීම මගිනි.



### විකරණය

**''ප්‍රකෘතිප්‍රත්‍යාන්තඃ පතති යඃ ප්‍රත්‍යඃ ස විකරණඃ''**[3] යන වාක්‍යට අනුව සාරස්වත කතුවරයා විකරණ හඳුන්වන්නේ ප්‍රකෘතිය ප්‍රත්‍යය යන දෙදෙනා අතර යම් ප්‍රත්‍යයක් වැටේ ද එය විකරණය වශයෙන් හඳුනාගත යුතුය යනුවෙන් තව ද **''ගණ විභාංග කරෝතීති විකරණඃ''** යන නිර්වචනයට අනුව ධාතු ගණයන්ගේ බෙදීම කරන ප්‍රත්‍යය විකරණ යැයි කියනු ලැබේ. ධාතුගණ පිළිබඳ විමසීමේදී මෙම කාරණය මනාව පැහැදිලි වේ. එනම් ධාතුන් ඒ ඒ ගණවලට බෙදා ඇත්තේ එම ධාතුව වරනැගීමේදී යෙදෙන විකරණය බැලීමෙන් ය. ඒ අනුව විකරණය ධාතුගණ බෙදීමට ද උපකාරී වී ඇත. නමුත් විකරණයේ ප්‍රධාන අරමුණ ආඛ්‍යාත පදයක් ලෙස වරනැගීමට අවශ්‍ය තත්ත්වය දක්වා ධාතුව සංවර්ධනය කිරිමයි.

ධාත්වංගය නම් ධාතුව විභක්තිය ප්‍රත්‍යය හා එක්වීමට සුදුසු අවස්ථාවයි. එනම් විකරණය හා එක්වූ අවස්ථාවයි. ධාතුවක් ධාත්වංගය දක්වා සංවර්ධනය වන ක්‍රම 10 ක් ව්‍යාකරණඥයෝ දක්වත්. එම අදහස් මෙතැන් සිට සලකා බලනු ලැබේ.

### භ්වාදිගණය

**''අප් කර්තරි''**[4] කර්තෘ කාරකයෙහි දී භ්වාදි ගණයට ''අප්'' ප්‍රත්‍ය විකරණය වශයෙන් යෙදෙන බව මේ සූත්‍රයෙන් කියවෙයි. එය තවදුරටත් විස්තර කරන සාරස්වත කතුවරයා ''ධාතොරප්‍රත්‍යයො **භවති කර්තරි විහිතේෂු ත්‍යාදිෂුචතුර්ෂු** දිප්පර්ය්‍යන්තේෂු **පරතඃ පකාරෝ විකර්ණභේදඥාපනාර්ථෝ** ගුණාර්ථශ්ච'' යනුවෙන් කර්තෘකාරකයෙහි කරන ලද්දා වූ ''දීප්'' ආදිය කෙළවර කොට ඇත්තා වූ තිබාදිය ආදිකොට ඇති සතර පරකල්හි ධාතු කෙරෙන් ''අප්'' ප්‍රත්‍යය වන බවත් එහි ''ප'' කාරය විකර්ණයාගේ වෙනස හැඟවීම ප්‍රයෝජන කොට ඇති බවත් එයට ම ගුණ කිරීම ප්‍රයෝජන කොට ඇති බවත් ප්‍රකාශ කරයි. ඒ අනුව වර්තමාන ''ලට්'' විධි සම්භාවන ලිඞ් ආශිර්ප්‍රේරණ ලෝට් අනද්‍යතනාතීත ලඞ් යන ලකාර සතර සම්බන්ධ භ්වාදි ගණයේ දී ''අ'' ප්‍රත්‍යය විකරණය වශයෙන් යෙදේ.

### ආදාදි ගණය

''අදාදේර් ලුක්''[5]''අදාදෙර්ගණාදුත්පන්නස්‍යාපො ලුග් භවති'' යන පැහැදිලි කිරීමට අනුව අදාදි ධාතු ගණයා කෙරෙන් ''අප්' විකරණයට ලුක් වන බව කියවේ. ඒ අනුව අදාදි ගණයේ දී විකරණයකින් තොරව ඍජුව ම ධාතුව ආඛ්‍යාත ප්‍රත්‍ය හා එක් වේ.

### භවදි ගණය

''**හ්වාදෙර් ද්විශච**''[6] යන සූත්‍රයට අනුව හ්වාදි ගණයට ද්විත්ව වීමක් මිස විකරණයක් නොදැක්වේ. ''**හූ ඉත්‍යාදේර් ගණාදුත්පන්නස්‍යපෝ ලුග් භවති, තස්මින් ලුකි සති ධාතෝර් ද්විර්වචනම්**'' යනුවෙන් ද පෙන්වා දෙන පරිදි ලට්, ලිඞ්, ලෝට්, ලඞ් යන ලකාර සතරේදී හ්වාදි ගණයාට ධාතුව ද්විත්ව වීමක් සිදු වීම මිස විකරණයක් නොයෙදේ.

### දිවාදි ගණය

''**දිවාදෙර්යඃ**''[7] ''**දිවාදෙර්ගණාද්‍යඃ පත්‍යයො භවති චතුර්ෂු**'' යනුවෙන් දක්වන පරිදි දිවාදි ගණයේදී ලට්, ලිඞ්, ලොට්, ලඞ් යන සර්වධාතුක ලකාර හතරේදී ''ය'' විකරණය වේ.

### ස්වාදි ගණය

''**ස්වාදෙර්නුඃ**''[8] ''**ස්වාදෙර්ගණාන්නු ප්‍රත්‍යයෝ භවති චතුර්ෂු අපෝ'පවාදඃ**'' යනුවෙන් විස්තර කරන පරිදි ස්වාදි ගණයා කෙරෙන් ලට්, ලිඞ්, ලොට්, ලඞ් යන සර්ව ධාතුක ලකාර හතරේදී ''නු'' ප්‍රත්‍ය විකර්ණ වශයෙන් යෙදේ.

### තුදාදි ගණය

''**තුදාරොරඃ**''[9] යන සූත්‍රය විස්තර කරන සාරස්වත කතුවරයා ''**තුදොදෙර්ගණාදප්‍රත්‍යයෝ භවති චතුර්ෂු පරේෂු**'' යනුවෙන් දක්වන ආකාරයට තුදාදි ගණයෙන් පරව ''අ'' ප්‍රත්‍ය විකරණය ලෙස ගැනේ. ඒ ද පෙර පරිදි සර්වධාතුක ලකාරවලදී ය.

### රුධාදි ගණය

''**රුධාදේර් නම්**''[10] ''රුධාදෙර්ගණනාන්නම් ප්‍රතයෝ භවති චතුර්ෂු පරේෂු'' යනුවෙන් පෙන්වා දෙන ආකාරයට රුධාදි ගණයේ ධාතුවලට සර්ව ධාතුක ලකාර වලදී ''න'' කාරය විකරණය වේ.



### තනාදි ගණය

''**තනාදෙරුප්**''[11] යන සූත්‍රයෙන් පෙන්වා දෙන පරිදි තනාදි ගණයෙන් පරව සර්වධාතුක ලකාරවලදී ''උප්'' ප්‍රත්‍ය විකරණය වේ. එය තවදුරටත් විස්තර කරන සාරස්වතය මෙසේ දක්වයි. ''**තනාදෙගණාදුප් ප්‍රත්‍යයෝ භවති චතුර්ෂු පරේෂු අපෝපාවදඃ**'' මෙයින් ''අප්'' විකරණයාගේ ප්‍රතික්ෂේප කිරීම ද ප්‍රකාශ කරන අතර ම තනාදි ගණයෙන් පරව ''උප්'' විකරණය වන බව ද පවසයි. මෙහි ද ''ප'' යන්න ගුණය පිණිස බැවින් විකරණය වශයෙන් ගැනෙන්නේ ''උ'' කාර පමණි.

### ක්‍රියාදි ගණය

''නා ක්‍රයාදෙඃ''[12] යන සූත්‍රය තවදුරටත් විස්තර කිරීමේ දී ''**ක්‍රියාදෙර්ගණාත්නා ප්‍රත්‍යයෝ භවති චතුර්ෂු පරේෂු**'' යනුවෙන් දක්වන පරිදි සර්ව ධාතුක ලකාරවලදී ක්‍රියාදී ගණික ධාතුන්ට ''නා'' ප්‍රත්‍ය වේ.

### චුරාදි ගණය

''**චුරාදේඃ**''[13] යන සූත්‍රය ''**චුරාදේර්ගණාත් ස්වාර්ථෙ ඤි ප්‍රත්‍යයෝ භවති**'' යනුවෙන් විස්තර කරන ආකාරයට චුරාදි ගණයෙන් පරව විකරණ වන්නේ ''ඤි'' ප්‍රත්‍යයයි. එය සිදුවන්නේ ස්වාර්ථයෙහිය. මෙය අබාදි විකරණයන් මෙන් ලඩාදි සතරෙහි පමණක් නොව දස ලකාරයෙහි ම වේ. නැවත ඒ ''ඤි'' ප්‍රත්‍යාන්තය '' ස ධාතුඃ'' යි ධාතුවක් මෙන් වීමෙන් ඉන් පරව ලඩාදි සතරෙහි අප් විකරණය ද වේ. මෙහි ''ඤි'' ප්‍රත්‍ය තුළ වූ ''ඤ්'' කාරය ඉත් අක්‍ෂරය යි. ඉතිරි වූ ''ඉ'' කාරය ''ගුණඃ'' යන්නෙන් ගණ වී ''ඒ'' කාරය වේ. එම ''ඒ'' කාරය ''ඒ අය්'' සූත්‍රයෙන් ''අය්'' බවට පත්වේ. ඒ අනුව මෙහි විකරණය ලෙස යොදන්නේ ''අය'' යන්නයි. ''ඤිත් ස්වරිතේත උභේ'' යන්නෙන් කී පරිදි ''ඤ'' කාරය ඉත් බැවින් චුරාදිය උභය පරිදි වේ.

මේ අනුව ධාතුගණවලට යෙදෙන විකරණ මෙසේය.

| | | |
|---|---|---|
| හ්වාදි ගණය | අ | විකරණය |
| අදාදි ගණය | | විකරණය නොමැත |
| හ්වාදි ගණය | | විකරණය නොමැත. |
| ධාතු ද්විත්ව වේ. | | |
| දිවාදි ගණය | ය | විකරණය |

| | | |
|---|---|---|
| ස්වාදි ගණය | නු | විකරණය |
| තුදාදි ගණය | අ | විකරණය |
| රුධාදි ගණය | න | විකරණය |
| තනාදි ගණය | උ | විකරණය |
| ක්‍රියාදි ගණය | නා | විකරණය |
| චුරාදි ගණය | අය | විකරණය |

වෙන් වෙන් ගණවලට අයත්වන ධාතුන්ගෙන් නිපන් එකම ලකාරයට එකම පුරුෂයට එකම වචනයට අයත් ක්‍රියාපද වුව ද මෙම විකරණයන් කරණකොට ගෙන එකකට එකක් වෙනස් වේ. නිදසුනක් ලෙස විවස්, විවෘ යන ධාතු ගතහොත් ඒවා භ්වාදි, දිවාදි, චුරාදි යන ගණවල යෙදේ. එම නිසා ඒවාගේ ලට් පරස්මෛපද ප්‍රථම පුරුෂ ඒකවචනය වෙනස් වන ආකාරය පැහැදිලි කර ගැනීමෙන් මෙය අවබෝධ කර ගැනීම පහසු වනු ඇත.

| ධාතුව | ගණය | ලට්, පර, ප්‍ර.පු ඒක වචනය |
|---|---|---|
| විවස් | භ්වාදි | වසති |
| විවස් | දිවාදි | වස්‍යති |
| විවස් | චුරාදි | වාසයති |
| විවෘ | භ්වාදි | වරති |
| විවෘ | ක්‍රියාදි | වෘණාති |
| විවෘ | චුරාදි | වාරයති |

ධාත්වංග සාධනය

පූර්වෝක්ත ගණ දහයෙන් ධාත්වංගය සෑදෙන ආකාරය හා එයින් ආඛ්‍යාත පද සෑදෙන ආකාරය මෙතැන් සිට විස්තරාත්මකව දක්වනු ලැබේ. එයි න් ද පළමු වර්ගය ලෙස ව්‍යාකරණඥයන් වෙන්කර දක්වන භ්වාදි, දිවාදි, තුදාදි, චුරාදි ගණ ප්‍රථමයෙන් විස්තර කරනු ලැබේ.

භ්වාදි ගණය

"අප් කර්කරි" යන සූත්‍රයෙන් දක්වූ පරිදි භ්වාදි ගණයට විකරණ වන්නේ "අප්" යන්නයි. එහි "ප" කාරය "ගුණාර්ථශ්ච" යන්නෙන් දක්වන පරිදි ධාතුවෙහි ගුණවීම ප්‍රයෝජන කොට ඇත්තේ වේ. "ගුණඃ"[14] යන සූත්‍රයෙන්



මෙහි ගුණවීම විස්තර කරන්නේ "ධාතොරන්ත්‍ය භූතස්‍ය නාමිනෝ ගුණෝ භවති" යනුවෙන් ධාතුවේ අන්තයෙහි වූ නාමින් ස්වරයට ගුණ වන බවයි. ඒ අනුව "භූ" ධාතුව තුළ වූ "ඌ" කාරයට "ඕ" කාරය වේ. එම "ඕ" කාරයට ද "ඕ අව්"[15] යන සූත්‍රයෙන් "අව්" ආදේශ වේ. විකරණය යෙදෙන්නේ ඉන් පසුවය. ඒ අනුව ධාත්වංග නිෂ්පත්තිය ලුහුඬින් මෙසේය.

භූ
භ් + ඌ
භ් + ඕ (ගුණඃ)
භ් + අව් (ඕ අව්)
භ් + අව් + අ (අ විකරණය යෙදී)
භව (ධාත්වංගය)
භවති (ආඛ්‍යාත ප්‍රත්‍ය යෙදී)

භ්වාදි ගණයට අයත් සියලු ධාතුවලින් ධාත්වංගය මේ න්‍යායෙන් සෑදේ.

දිවාදි ගණය

"දිවාදෙර්යඃ" යන සූත්‍රයෙන් පෙන්වූ ආකාරයට දිවාදි ගණික ධාතුවලට විකරණ වන්නේ "ය" කාරයයි. ධාතුව හා විකරණය එක් වීමේ දී "ය්වෝර්ව් හසේ" යන සූත්‍රයෙන් ඉකාරයට දීර්ඝ වීම ද වේ.

| | |
|---|---|
| දිව් + ය | (ය විකරණය යෙදී) |
| දිව් + ය | (ය්වෝර්ව් හසේ) |
| දීව්‍ය | (ධාත්වංගය) |
| දීව්‍යති | (ආඛ්‍යාත ප්‍රත්‍යයයේදී) |

තව ද "යෝස්‍යඃ"[16] යන සූත්‍රයෙන් විස්තර කරන "ය ප්‍රත්‍යයේ පරේ ධාතොරෝකාරස්‍ය ලෝපො භවති" යන්නෙන් දක්වන පරිදි "ය" ප්‍රත්‍යය පරකල්හි ධාතුහු පිළිබඳ "ඕ" කාරයට ලෝපය වේ. ශො (කෘශ කිරීමෙහි) ධාතුව ගත් විට ලට් පර ප්‍ර.පු ඒක වචනය වන්නේ 'ශ්‍යති" යන්නයි. "ශ්‍ය" ධාත්වංගයයි.

''ශමාං දීර්ඝඃ''[17] යන සූත්‍රයෙන් විස්තර වන ''ශමාදිනාං දීර්ඝෝ භවති යෙ පරේ'' යන්නෙන් දක්වන පරිදි ශම් ආදි ධාතුන්ට දීර්ඝ වේ. ''ශාම්‍ය'' යනු ධාත්වංගය වන අතර ''ශාම්‍යති'' යනු ලට් පර. ප්‍රථම පුරුෂ ඒක වචනයයි.

''ඥාජනෝර්ජා''[18] යන සූත්‍රයෙන් දක්වන ආකාරයට ''ය'' විකරණය පර කල්හි ජන් ධාතුවට ජා ආදේශ වේ. ''ජාය'' යනු ධාග්වංගය වන අතර ''ජායතේ'' යනු ලට් ආත්මනේ පද ප්‍ර.පු. ඒක වචනය යි.

**තුදාදි ගණය**

''තුදාදොරඃ'' යන සූත්‍රයෙන් දක්වූ පරිදි තුදාදි ගණයේ විකරණය වන්නේ ''අ'' කාරය යි. ඒ අනුව පද සාධනය මෙසේ ය.

| | |
|---|---|
| තුද් | (ධාතුව) |
| තුද් + අ | (විකරණය යෙදී) |
| තුද | (ධාත්වංගය) |
| තුදති | (ආඛ්‍යාත ප්‍රත්‍යය යෙදී) |

මෙහිදී ''මුචාදේර් මුම්''[19] යන සූත්‍රයෙන් දක්වන ''මුචාදීනාං මුමාගමෝ භවති අප් ප්‍රත්‍යයේ පරේ'' යන්නට අනුව ''අ'' විකරණය පර කල්හි මුච් ආදී ධාතුන්ට (මුච්, ලුප්, විද්, ලිප්, සිච්, කෘත්, පිශ්, ඛිද් එනේ මුචාදය) ''ම්'' ආගම වේ. ''මුඤ්චති'' යනු ලට්, පර, ප්‍ර.පු. ඒක වචනයයි.

මේ ගණයට අයත් ඉෂ් ධාතුව ධාත්වංගය දක්වා සංවර්ධනය වීමේ දී ''ෂ්'' යන්නට ''ගමාඃ ඡඃ'' යන සූත්‍රයෙන් ''ඡ'' ආදේශ වේ. ඒ අනුව ''ඉච්ඡති ඉච්ඡෙත්, ඓච්ඡත්'' යනු සර්ව ධාතුක ලකාර සතරෙහි ප්‍රථම පුරුෂ ඒක වචන රූපයෝ ය.

තවද ''අයඞි''[20] යන සූත්‍රයෙන් සමහර ධාතුගත ''ඍ'' කාරයට ''රි'' ආදේශ වේ. ''ඍකාරස්‍ය රිආදේශෝ භවති අකාරේ ප්‍රත්‍යයේ යකිච පරේ'' යනුවෙන් විස්තර කරන්නේ එයයි. ඒ අනුව මෘ (මරණයෙහි) ධාතුව ම්‍රියතේ ලෙස ලට්,ආත්, ප්‍ර. පූ. ඒක වචනය වරනැගේ.



**චුරාදි ගණය**

තවද''චුරාදේඃ'' යන සූත්‍රයෙන් පැහැදිලි කළ ආකාරයට චුරාදිගණික විකරණය ''අය'' යන්නයි. අය විකරණය හා එක් වීමේදී ධාතුවෙහි ස්වරය ''අ'' හැර වෙනත් එකක් නම් එයට ගුණ වේ.

චුර් + අය + ති
චෝර් + අය + ති (ගුණඃ)
චෝරයති

''චුරාදේර්ණිර්වේති කේචිත්'' යන්නට අනුව ''චුරාදි ගණයා කෙරෙන් ''ණි'' ප්‍රත්‍යය විකල්පයෙන් සිද්ධ වන බව සමහරු කියත්'' යැයි සරස්වත කතුවරයා ප්‍රකාශ කරයි. චිතී ධාතුව චින්තති, චින්තතු ආදි ලෙස වරනැගෙන්නේ ඒ අනුවයි.

චිත් ධාතුවට ''ඉදිතො නුම්'' යන සූත්‍රයෙන් ''නුම්'' ආගම වී චින්තයති ආදි වශයෙන් වරනැගේ.

''අ'' කාරය හැර ධාතුවේ මධ්‍යස්ථ හ්‍රස්ව ස්වරයක් වේ නම් එය ගුණවීමත් ධාතු මධ්‍ය ''අ'' කාරය වෘද්ධි වීමත් ධාතුවේ ආන්ත්‍යස්ථ ස්වරය වෘද්ධි වීමත් මෙම ගණයේ ස්වභාවය වුව ද එසේ නොවන ධාතු ද වේ.

**දෙවන වර්ගයට අයත් ධාතුගණ වලින් ශිථිල ධනිකාංග සාධනය**

අදාදි, හ්වාදි, ස්වාදි, රුදාදි, තනාදි, ක්‍රියාදි යන මේවා දෙවැනි වර්ගයට අයත් ගණයෝ යි. දෙවන වර්ගයෙහි ධාතුවල දී අදාදි ගණයේ දී විකරණය රහිතව ද හ්වාදි ගණයේ දී ධාතුව ද්විත්ව වීමෙන් ද ස්වාධි, රුදාදි, තනාදි ක්‍රියාදි ගණවල දී ''නු, න, අ, නා'' යන විකරණ යෙදීමෙන් ද ධාත්වංගය සෑදේ. මෙම දෙවන වර්ගයේ විශේෂත්වය නම් ධාත්වංගය ප්‍රබල හා දුර්වල වශයෙන් ප්‍රභේද දෙකකින් යුක්ත වීම යි. මේ සඳහා ශිථිල (week) ධනිත (strong) යන නම් ද භාවිත කෙරේ.

ධාත්වංගය ප්‍රබල වන අවස්ථා

◈ ලට් පරස්මෛපද ඒක වචනත්‍රය

- ලඞ් පරස්මෛපද ඒක වචනත්‍රය
- ලෝට් පරස්මෛපද ප්‍රථම පුරුෂ ඒක වචනය
- ලෝට් පරස්මෛපද හා ආත්මනේ පද උත්තම පුරුෂ සියලු පද

යන මේ ස්ථාන දහ තුනේදී ධාත්වංගය ප්‍රබල වන අතර අන් ස්ථාන සියල්ලෙහි ම දුර්වල ස්වරූපයෙන් සිටී. ඒ අනුව පැහැදිලි කරගත හැකි කරුණක් නම් ප්‍රබල අංගය යෙදෙන්නේ ''ප්'' යන්නෙන් ඉත් කර ඇති ආඛ්‍යාත ප්‍රත්‍යයන්ට පමණක් බවයි. ලට් පරස්මෛපද ඒකවචනත්‍රය ''තිප්, සිප්, මිප්'' වශයෙන් ''ප'' ඉත් කොට ඇත. ලඞ් පරස්මෛපද ඒක වචනත්‍රය දිප්, සිප්, අම්ප්, යනුවෙන් ද, ලෝට් පරස්මෛපද ප්‍රථම පුරුෂ ඒක වචනය ''තුප්'' යනුවෙන් ද ලෝට් පරස්මෛපද උත්තම පුරුෂ ප්‍රත්‍යයත්‍රය ''ආනිප්, ආවප්, ආමප් වශයෙන් ද ආත්මනේ පද උත්තමපුරුෂ ප්‍රත්‍යයත්‍රය ඓප්, ආවහෛප්, ආමහෛප් වශයෙන් ද ''ප'' කාරය ඉත් වේ. ඒ අනුව ධාත්වංගය තැනෙන ආකාරය හා ඉහත ස්ථානයන්හි ඒ ඒ ගණවල දී ධාත්වංගය ප්‍රබල වන ආකාරය මෙතැන් සිට විමසා බලනු ලැබේ.

### අදාදි ගණය

**''අදාදෙර් ලුක්''** යන සාරස්වත සූත්‍රයෙන් දක් වූ පරිදි අදාදි ගණයේ දී විකරණය ලොප් වේ. **අදාදෙර්ගණාදුත්පන්නස්‍යාපෝ ලුග් භවති''** යනුවෙන් පෙර භ්වාදි ගණය ආදාළව කී ''අප්'' විකරණ ආදිය මෙහිදී ලුක් වී විකරණයකින් තොරව ධාත්වංගය නැතහොත් ලකාරංගය නිර්මාණය වේ. එහිදී ධාතුගත ස්වරය ගුණ හෝ වෘද්ධි වීමෙන් ප්‍රබලව හා දුර්වල ව ලකාරංග සෑදේ. ''ණු'' (ස්තුති කිරීමෙහි) ධාතුව ලට් පර. ප්‍ර. පු. ඒකවචනයෙහි වරනැගෙන්නේ ''නෞති, නුතඃ නුවන්ති'' වශයෙනි. ඒ අනුව ''නෞ'' ප්‍රබල අංගය ද ''නු'' දුර්වල අංගය ද වී ඇත. ''විද්'' ධාතුව ''වේත්ති, විත්තිඃ විදන්ති'' වශයෙන් වරනැගෙමින් ප්‍රබල අංගය ''වේද්'' වශයෙන් ද දුර්වල අංගය ''විද්'' වශයෙන් ද සිටී. ''දිස්යෝර්හසාත්'' සූත්‍රයේ ''සම්ප්‍රසාරණම්'' ''උඔ'' ''ඔඔෟඔෟ'' ''ඔරෞ'' යන සූත්‍රවලින් ධාතුගත උකාරයට ''උ'' හෝ ''ඔෟ'' කාරය ද ඉණ් නතෞ



ගුණ ඒති'' යන සූත්‍රයට අනුව ''ඉ'' කාරයට ''ඒ'' කාරය වීමත් මෙහි ප්‍රබල අංගය සාධනයේ දී සිද්ධ වේ.

### හ්වාදි ගණය

**''හ්වාදෙර් ද්විශ්ච''** යන සූත්‍රයෙන් පෙන්වා දෙන පරිදි හ්වාදි ගණයේ දී ''අප්'' විකරණය ලොප් වී, ධාතුව ද්විත්ව වීමෙන් ලකාරංගය සෑදේ. ''හු'' ධාතුව ගත් කළ ''කුහොශ්චුඃ'' සූත්‍රයෙන් ''හ'' කාරයට ''ඣ'' කාරය වී ඊට ''ඣපානාම්'' යන්නෙන් ජකාරය වේ. ප්‍රබලාංගය සෑදීමේ දී ''ගුණඃ'' යන සූත්‍රයෙන් ධාතු ගුණ වේ. ''ජුහෝති ජුහුතඃ ජුහ්වත්ති''යනු ලට් පර. ප්‍රථම පුරුෂයයි. ''ජුහෝ'' යනු ප්‍රබලාංගය ද ''ජුහු'' යන දුර්වලාංගයද වේ. (භයවීමෙහි) ධාතුව ගත්කළ ධාතුව ද්විත්ව වී පළමු ''භි'' යන්නට ''ඣපානං චපාඃ'' යන සූත්‍රයෙන් ''බ'' යන්න වී **බිභේති, බිභීතඃ** වශයෙන් ලට්, පර. ප්‍ර. පුරුෂයේ වරනැගේ.

තව ද **''ඍප්‍රොඃ''**[21] යන සූත්‍රයෙන් ''ඍප්‍රොඃ පූර්වස්‍ය ඍකාරස්‍ය ඉකාරෝ භවති ලුකි සති ගුණ'' යනුවෙන් දක්වන පරිදි ''පෘ'' ආදි ධාතුන්ගේ පූර්ව ඍකාරයට ඉකාරය වී ''පිපර්ති'' යනාදී වශයෙන් වරනැගේ ''පිපර්ති'' යනු ලට්, ප්‍ර.පු. ඒක වචනයි. **''පොරුර්''**[22] යන සූත්‍රයට අනුව කිත් වුද ප්‍රත්‍යයන් පරකල්හි පවර්ගයා කෙරෙන් පර ''ඍ'' කාරයට ''උර්'' වේ. එයට ම ''ය්වෝර්වි හසේ'' යන සූත්‍රය නිසා දීර්ඝ ද වේ. එබැවින් ''පෘ'' ධාතුවේ ලට්, පර.ප්‍රථම පුරුෂ මධ්‍යම පුරුෂ ද්වි වචනය හා බහු වචනය පිපූර්තඃ පිපූරති වශයෙන් වරනැගේ.

'දා' (දීමෙහි) ධාතුව ද්විත්ව වී දදාති ලෙස ලට් ප්‍රථම පුරුෂ ඒක වචනය ලැබේ. එය ප්‍රබල අංගයයි. දුර්වල අංගය සෑදීමේ දී ''දාදෙඃ''[23] යන සූත්‍රයෙන් දා ආදි ධාතුන්ගේ ආකාරය ලොප් වේ. ''දත්තඃ-දදති'' වශයෙන් දුර්වල අංගයෙන් ලට් ප්‍රථම පුරුෂ ද්වි, බහු වචන ලැබෙන්නේ එහෙයිනි.

හ්වාදි ගණයෙහි ද්විත්වය සිදුවූ ආකාරය අවබෝධ කර ගැනීමට සංස්කෘත ආඛ්‍යාත පදයන්හි සිදුවන්නා වූ ද්විත්වය පිළිබඳ මූලධර්ම දැනගැනීම අවශ්‍ය වේ. මේ ඊහා සම්බන්ධ ද්විත්ව රීති කීපයකි.

1. ධාතුවේ ප්‍රථමාකාරය නොහොත් ස්වරයකින් අවසන්වන කොටස පමණක් ද්විත්ව වේ.

පත් > පපත්
බුධ් > බුබුධ්

2. මහාප්‍රාණාක්ෂර ද්විත්වයේ දී ස්වකීය අල්පප්‍රාණ භාවයෙන් පෙනී සිටී.

භිද් > බිභිද්
ධා > දධා

3. කණ්ඨජාක්ෂර ද්විත්වයේ දී සජාතීය තාලුජාක්ෂර බවට පැමිණේ ක, ඛ, වෙනුවට ''ච''

ද ''ග, ඝ'' වෙනුවට ''ජ'' ද ''හ'' වෙනුවට ''ජ'' ද වේ.

කම් > චකම්
ගම් > ජගම්
ඛිද් > චිඛිද්
හු > ජුහු

4. සංයුක්ත ව්‍යංජනයකින් ධාතුව ඇරඹේ නම් එහි පළමු වන ව්‍යංජනය ඉක්බිතිව ඇති ස්වරය සමඟ ද්විත්වයට පැමිණේ.

ක්ෂිප් > චික්ෂිප්
ක්‍රම් > චක්‍රම්
භ්‍රම් > බභ්‍රම්

මෙසේ වුව ද සංයුක්ත ව්‍යංජනයෙහි ප්‍රථමාක්ෂරය ශ්, ෂ්, ස්, යන තුනෙන් එකක් නම් ඊළඟ ව්‍යංජනය අඝෝෂයක් වී නම් එම ද්විත්වයට ලක්වන්නේ ඉන්පසුව ඇති ස්වරය සහිත වූ මේ අඝෝෂය යි.

ස්කන්ද් > චස්කන්ද්
ශ්චුත් > චුශ්චුත්
ස්ථා > තස්ථා



5. ධාතුවක මැද හෝ අග ඇති ස්වර දීර්ඝ නම් ද්විත්වයේ දී එය හ්‍රස්ව වේ.

ධා > දධා
ස්ථා > තස්ථා

6. ද්විත්වයෙහි වූ ''එ'' කාරයට ''ඉ'' කාරය ද ''ඕ'' කාරයට හෝ ''ඖ'' කාරයට ''උ'' කාරය ද ආදේශ වේ.

සේව් > සිෂේව්

7. ද්විත්වයෙහි වූ ඍ කාරයට හෝ ඎ කාරයට ඉ කාරාදේශය වේ.

භෘ > බිභෘ
පෘ > පිපෘ

ස්වාදි ගණය

''ස්වාදේර් නුඃ'' යන සූත්‍රයෙන් දැක්වූ පරිදි ස්වාදි ගණයේ විකරණය ''නු'' අක්ෂරයයි. ''නපඃ'' යන සූත්‍රයෙන් **''විකරණස්‍ය නුප්‍රත්‍යස්‍ය උප් ප්‍රත්‍යයස්‍ය ච ගුණෝ භවති පිති පරේ''** යනුවෙන් දක්වන පරිදි ''ප'' යන්න ඉත් කොට ඇති ප්‍රත්‍යය පර කල්හි ''නු'' ප්‍රත්‍යයට ද ''උප්'' ප්‍රත්‍යයට ද ගුණ වීමෙන් ප්‍රබල ලකාරංගය සෑදේ. සුනොති සුනුතඃ සුන්වන්ති ලෙස ''සුනෝ '' යනුවෙන් ප්‍රබලාංගය ද ''සුනු'' ලෙස දුර්වලාංගය ද ලැබෙන්නේ එහෙයිනි.

රුධාදි ගණය

**''රුධාදෙර්නම්''** යන සූත්‍රයෙන් දැක්වූ පරිදි රුධාදි ගණයේ විකරණය ''න'' යන්නයි. මෙහි විශේෂත්වය නම් අන් ධාතු ගණවල මෙන් ධාතුව අග නොව ''න'' විකරණය යෙදෙන්නේ ධාතුගත ස්වරයටත් ව්‍යංජනයටත් අතර වීමයි. ප්‍රබල අංගයේදී ''න'' කාරය එලෙසම යෙදෙන අතර දුර්වල

අංගයේදී ''අපෝ අපවාදඃ' යන්නෙන් ''න'' කාරගත''අ'' කාරය ලොප් වේ. රුනද්ධි රුන්ධතඃ රුන්ධන්ති වශයෙන් ප්‍රබලාංගය ''රුනධ්'' ද දුර්වලාංගය ''රුන්ධ්'' ද වන්නේ එලෙසිනි.

**තනාදි ගණය**

**''තනාදේරුප්''** යන සූත්‍රයෙන් විස්තර කළ ආකාරයට මෙම තනාදි ගණයේ විකරණය ''උප්'' යන්න ය. එයින් ද ''ප'' ඉත් බැවින් ''උ'' කාරය විකරණය වේ. ''නුපඃ'' යන සූත්‍රයෙන් දක්වූ පරිදි ස්වාදි විකරණය වන ''නු'' කාරයට ද මෙහි ''උ'' කාරයට ද ගුණ වේ. ඒ අනුව තනොති තනුතඃ තන්වන්ති වශයෙන් ලට් පර ප්‍ර. පුරුෂ ය වරනැගෙමින් ''තනො'' ප්‍රබලාංගය වශයෙන් ද ''තනු'' දුර්වලාංගය වශයෙන් ද පෙනී සිටී.

මේ තනාදි ගණයේ සහ පෙර සඳහන් කළ ස්වාදි ගණයෙහි විකරණ ගත ''උ'' කාරය උත්තම පුරුෂ ද්වි වචන හා බහු වචනවල වකාර මකාර ප්‍රත්‍ය පර කල්හි විකල්පයෙන් ලොප් වේ. එහෙත් ධාතුව ව්‍යඤ්ජනාන්ත නම් මේ ''උ'' කාරය ලෝප නොවේ. උකාරයට පූර්ව එක් ව්‍යංජනයක් සිටින විට ස්වරාදි විභක්ති පරතත්හි එම උකාරයට ''ව්'' කාරාදේශය ද, ව්‍යංජන දෙකක් පෙරටුව සිටි කල්හි ස්වරාදි විභක්ති පර තත්හි එම උකාරයට ''උව්'' ආදේශය ද වේ.

**ක්‍රියාදි ගණය**

**''නා ක්‍රියාදේඃ''** යන සූත්‍රයේ පැහැදිලි කළ ආකාරයට ක්‍රියාදි ගණික විකරණය ''නා'' වේ. ප්‍රබලාංගයේ දී ''නා'' විකරණය එලෙසම පවතින අතර දුර්වලාංගයේ දී ''ඊ හසේ''[24] යන සූත්‍රයේ **''නා ඉත්‍යස්‍යාකාරය්‍ය ඊ කාරෝ භවති ඩිති හසේ පරේ''** යනුවෙන් විස්තර කරන පරිදි නා විකරණය නී බවට හැරේ. එමෙන් ම ''නාතඃ''[25] යන සූත්‍රයෙන් ''නා ඉත්‍යාස්‍යාකාරය්‍ය ලෝපෝ භවති ඩිති ස්වරේ පරේ'' යනුවෙන් විස්තර කරන පරිදි ඩිත් ස්වරයාපර කල්හි නා විකරණගත ''ආ'' කාරයට ලෝපය වේ.ක්‍රීණාති ක්‍රීණීතඃ ක්‍රීණන්ති යන මේ ලට් පර ප්‍රථම පුරුෂාගත ''ක්‍රීණා'' වශයෙන් ප්‍රභලාංගය ද ''ක්‍රීණී'' වශයෙන් දුර්වලාංගය ද ක්‍රීණන්ති වශයෙන් ''අ'' ලෝපය ද සිදුවන්නේ එම ඉහත නීතිවලට අනුවයි.



''ජ්වාදෙර් හ්‍රස්වඃ[26] යන්නෙන් දක්වන පරිදි සර්ව ධාතුක ලකාරවලදී පූ ආදී ධාතූන්ට හ්‍රස්වය වී පුනාති ආදී වශයෙන් වරනැගේ.

තව ද ''හසාදාන හෞ''[27] යන සූත්‍රයෙන් දක්වන පරිදි ''හි'' ප්‍රත්‍යය පරකල්හි හස ප්‍රත්‍යාහාර වර්ණයක් හෙවත් ව්‍යංජනයක් අන්ත කොට ඇති ක්‍රියාදි ගණයා කෙරෙන් පරව ''ආන'' ප්‍රත්‍යය විකරණය වන අතර නා ප්‍රත්‍යයාගේ වැලැක්වී සිටීම ද වේ. ලෝට් පරස්මෛපද මධ්‍යම පුරුෂ ඒක වචනයෙහි ගෘහාණ, බධාන, මථාන ආදි වශයෙන් පද යෙදෙන්නේ එබැවිනි.

මෙහි ඥා ධාතුවට ''ඥාජනෝර්ජා'' සූත්‍රයෙන් ''ජා'' ආදේශ වේ. ජානාති ලට් ප්‍ර. පු. ඒක වචනයි. ජානාතු ලෝට් ප්‍ර.පු ඒක වචනයි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


1.සාරස්වත චන්ද්‍ර කීර්ති ටීකාව 217 පිට
2. -එම- 217 පිට
3.සාරස්වත තෘතීය කාණ්ඩය 11 සූත්‍රය

4.සාරස්වත තෘතීය කාණ්ඩය 111 සූත්‍රය
5. එම 114 සූත්‍රය
06. එම 138 සූත්‍රය
7.සාරස්වත චතුර්ථ කාණ්ඩය 151 සූත්‍රය
8. එම 156 සූත්‍රය
9. එම 167 සූත්‍රය
10. එම 161 සූත්‍රය
11. එම 163 සූත්‍රය
12. එම 170 සූත්‍රය
13. එම 175 සූත්‍රය
14.සාරස්වත තෘතීය කාණ්ඩය 12 සූත්‍රය
15.සාරස්වත ප්‍රථම කාණ්ඩය 21 සූත්‍රය
16.සාරස්වත චතුර්ථ කාණ්ඩය 152 සූත්‍රය
17. එම 153 සූත්‍රය
18. එම 154 සූත්‍රය
19. එම 168 සූත්‍රය
20. එම 169 සූත්‍රය
21. එම 141 සූත්‍රය

| | | |
|---|---|---|
| 22. | එම | 142 සූත්‍රය |
| 23. | එම | 146 සූත්‍රය |
| 24. | එම | 171 සූත්‍රය |
| 25. | එම | 172 සූත්‍රය |
| 26. | එම | 173 සූත්‍රය |
| 27. | එම | 174 සූත්‍රය |